# ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. නියමිත සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන් විසින් සකස් කර ගන්නා ලද තම ජීවදත්ත සහිත අයදුම්පත් අධ්‍යාපන සහතිකවල පිටපත් ද සමඟ **2020.10.09** දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08. යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (කරුණාකර ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.)

### 01. සහකාර පුවත්පත් කොමසාරිස් (තනතුරු 01)

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම් :**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය/ ජනසන්නිවේදනය/ සමාජ විද්‍යාව/ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශේෂවේදී උපාධියක් හෝ මෙම විෂයන් එකක් සහිතව ලබාගත් සාමාන්‍ය උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයන්ගෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

- රජයේ දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විමර්ශන ක්ෂේත්‍රයේ වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය/ ජනසන්නිවේදනය/ සමාජ විද්‍යාව/ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ලබාගත් විශේෂවේදී උපාධියක් හෝ මෙම විෂයන් එකක් සහිතව ලබාගත් සාමාන්‍ය උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයන්ගෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

(ආ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ විමර්ශන ක්ෂේත්‍රයේ තනතුරක වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් පරිමාණය :**

MM -1-1-2016 රු.53,175.00 _10 x 1375_ 15x1910 = රු.95,575.00 (මාසික)

මෙම වැටුප 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි විධිවිධාන වලට අනුව 2020 සිට ක්‍රියාත්මක වනු ලබන අතර එහි උප ලේඛන II හි සඳහන් පරිදි වර්තමානයේදී වැටුප් ගෙවනු ලැබේ.)

### 02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (තනතුරු 01)

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම් :**

අ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ, ඉංග්‍රීසි, ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සහිතව එක්වරක දී විෂයයන් 6 කින් සමත්වී තිබීම.

සහ

ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයන් 03 ක් එක්වරක දී සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

හෝ

අ.පො.ස. (උ.පෙළ) පැරණි විෂය නිර්දේශයේ විෂයයන් හතරක් එක්වරකදී සමත්වී තිබීම.

ඇ) **තනතුරට විශේෂ වෙනත් සුදුසුකම්**

සෑම අයදුම්කරුවෙකුටම තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ හැකියාව තිබිය යුතුය. (පරිගණක වදන් සැකසුම/ යතුරුලියනය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ආයතනයකින් මාස හයකට නොඅඩු පරිගණක පාඨමාලාවක් හදාරා තිබිය යුතුයි.)

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අ) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ආ, ඇ සහ ඉ හි සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගය එක් වරකදී පළමු භාෂාව/ ගණිතය යන විෂයයන් දෙකට සම්මාන සහිතව විෂයයන් 06 කට නොඅඩුව සමත් වී තිබිය යුතුය. (පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ආයතනයකින් මාස හයකට නොඅඩු පරිගණක පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ප්‍රමාණය :**

MA 1-1-2016 රු.27,910_300x10_350x7_495x4_660x20_ = රු.48,540.00

මෙම වැටුප 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි විධිවිධාන වලට අනුව 2020 සිට ක්‍රියාත්මක වනු ලබන අතර එහි උප ලේඛන II හි සඳහන් පරිදි වර්තමානයේදී වැටුප් ගෙවනු ලැබේ.)

**සේවා හා කොන්දේසි**

1. තෝරා ගනු ලබන අයදුම්කරුවන් තම වැටුපෙන් 10% දායකත්වයක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සපයන අතර ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තයන්ගේ අරමුදල (ETF) සඳහා 3% ක දායකත්වයක් ද කරනු ඇත.
2. රජයේ දෙපාර්තමේන්තුවක ස්ථිර තනතුරු දරන අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවහොත්, ඔවුන් ආයතන, අධ්‍යක්ෂ ජනරාල් වෙතින් තමන් නිදහස් කර ගත යුතුය. අප ආයතනයේ සේවයේ නිරතව සිටින විට ඔවුනට විශ්‍රාම වැටුපට හිමිකමක් නොමැත.
3. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන්නේද යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය.
4. ඉහත වැටුපට අමතරව රජය විසින් ලබාදෙන සියලු දීමනා හිමිවේ.
5. අදාළ තනතුර සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**අපැහැදිලි අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

පුවත්පත් කොමසාරිස්,
**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,**
155/15, කාසල් වීදිය, බොරැල්ල,
කොළඹ 8.